## කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනය - 2014

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සහ 18 වන වගන්තිය යටතේ පනවා ඇති 2008 අංක 02 දරන කොළඹ විශ්වවිද්‍යාලීය කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතන නියමාවලියේ 27 වගන්තිය හා විශ්වවිද්‍යාල පනතේ 108(1) සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. අචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත්, ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2. ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 31 දිනට පාරිතෝෂික වෙන්කිරීම රු.1,658,383 ක් වුවද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ රු.1,640,595 ක් ලෙස දැක්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ජංගම නොවන වගකීම් රු.17,788 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ පරිත්‍යාග වශයෙන් ලැබුණු භාණ්ඩ අගය කර ගිණුම්වල සටහන් කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.2 නොසැසඳූ පාලන ගිණුම්**

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගොඩනැගිලි වටිනාකම එයට අදාල උපලේඛන සමඟ සැසඳීමේදී රු.413,544 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර ඒ අනුව වර්ෂයේ ක්ෂයවීම් රු.2,966 කින් වැඩියෙන් දක්වා තිබුණි. එමෙන්ම කාර්යාල උපකරණ වටිනාකම වත්කම් ලේඛනය සමග සැසඳීමේදී රු.8,266 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර වර්ෂය සඳහා ක්ෂය ප්‍රමාණය රු.5,044කින් වැඩි වී තිබුණි.

**2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

ආයතනය විසින් රු.25,000 ක් වටිනා ලිත් 2,500 ක් මුද්‍රණය කර තිබූ අතර මෙම ලිත් ගබඩාවට ලැබුණු බවට ඉන්වෙන්ට්‍රි ලේඛනයේ සටහන් කර තිබූ නමුත් ඒවා නිකුත් කළ බවට සාක්ෂි ඉදිරිපත් නොවීය.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගොවීන්ගේ භාරකාර අරමුදලින් ලබාදී තිබූ රු.2,000,000 ක ණය මුදලින් 2014 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ණය වාරික වටිනාකමින් රු.136,090 ක් අය වී නොතිබුණි.

(ආ) ග්‍රාමීය ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන යටතේ ආයතනය විසින් 2012 වර්ෂයේ ගොවීන් සඳහා ලබාදී තිබූ ණය මුදල් ගිවිසුම් අනුව 2014 නොවැම්බර් මාසය අවසන් වන විට

සම්පූර්ණයෙන් පියවිය යුතු වුවත් ගොවීන් 9 දෙනෙකුගෙන් එකතුව රු.217,153 ක මුදලක් විගණිත දිනය වන විටත් අයකරගෙන නොතිබුණි.

**2.4 නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති , රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ දෙවන කොටසේ XXVI පරිච්ඡේදයේ 2.7 ඡේදය | මිලට ගත් හෝ තෑගි හෝ දීමනා වශයෙන් ලැබූ සියළුම වත්කම් ඉන්වෙන්ට්‍රි ලේඛනවල ඇතුළත්ව ඇති බවට භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය සෑහීමකට පත්විය යුතු වුවත් 2014 අගෝස්තු 26 දින ජාතික මාර්ගගත දුරස්ථ අධ්‍යාපන සේවා මධ්‍යස්ථානයෙන් ලැබුණු භාණ්ඩ ඉන්වෙන්ට්‍රි ලේඛනයට ඇතුලත් කිරීමකින් තොරව තොග සමීක්ෂණය සිදුකර තිබුණි. |
| (ආ) | 1979 නොවැම්බර් 13 දිනැති අංක 48 (4) දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛනය විධිමත් පරිදි පිළියෙල කර නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.2,789,001 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.6,301,901 ක් වී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.9,090,902 කින් පිරිහී තිබුණු අතර මෙම පිරිහීම කෙරෙහි සේවක පරිපාලන වියදම් රු.4,108,690 කින් සහ ගමන් වියදම් රු.1,507,153 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්ය සාධනය**

කෘෂි තාක්ෂණ හා ග්‍රාමීය විද්‍යා ආයතනය විසින් 2009 වසර ආරම්භයේදී පළමු පාඨමාලාව ආරම්භ කර තිබූ අතර එම පාඨමාලාව උපාධියක් දක්වා හැදෑරීමේදී ආයතනය විසින් වසර 05 ක කාල සීමාවක් තුලදී උපාධියට අදාළ විෂය නිර්දේශය ආවරණය කළ යුතු වුවත් විගණිත දිනය වූ 2015 ජුලි 03 වන විට පාඨමාලාව ආරම්භ කර අවුරුදු 06 මාස 06 කට ආසන්න කාලයක් ගතවී තිබුණද අවසන් අදියර වූ පර්යේෂණ නිබන්ධනයේ වැඩ ආරම්භ කර නොතිබුණි.

**4.2 කාර්යමණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 දෙසැම්බර් 31 දිනට කාර්ය පැවරුම් පදනම මත බඳවාගත් සේවකයින් 36 දෙනෙකුගෙන් සේවකයින් 11 දෙනෙකු වසර 05 කට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර තිබුණු අතර සේවා කාලය වසරින් වසර දීර්ඝ කර තිබුණි.

(ආ) පටක රෝපණ කෙසෙල් පැළ නිෂ්පාදනයට සෘජුවම දායක වන පටක රෝපණ විද්‍යාගාර හා හරිතාගාරවල සියලුම සේවකයින් සහ මෙහෙයුම් සහ අධීක්ෂණ කටයුතු සඳහා අනුමත සේවක මණ්ඩලයක් පවත්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2014 ඔක්තෝබර් මාසයේදී රු.75,000 ක මාසික දීමනාවක් මත ව්‍යාපෘති කළමනාකරුවෙකු පත්කර තිබූ අතර පත්වීමට අදාළ කාර්යසාධන සපුරා නොතිබියදී ව්‍යාපෘති කළමනාකරණ දීමනා වශයෙන් රු.225,000 ක් ගෙවා තිබුණි.

**4.3 හඳුනාගන්නා ලද පාඩු**

ආයතනය විසින් 2011 සිට 2014 වර්ෂය තුළදී මිලදීගත් රු.81,679 ක් වටිනා තොග කල්ඉකුත් වී තිබූ බව 2015 ජුලි 03 දින භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ අතර එම තොග සෙමින් චලනය වන තොග වූ අතර අවශ්‍ය ප්‍රමාණය ඉක්මවා මිලදී ගැනීම නිසා එම තොග කල් ඉකුත් වී තිබුණි.

**4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයට අයත් වර්ග අඩි 1,947 ක ගොඩනැගිල්ලෙන් වර්ග අඩි 1,157 ක ප්‍රමාණයක් ප්‍රයෝජනයකට ගැනීමකින් තොරව වර්ෂ 03 කට අධික කාලයක් නිෂ්ක්‍රීයව පවතින බව නිරීක්ෂණය විය.

(ආ) රජය විසින් ආයතනයට ලබාදී තිබුණු ප්‍රාග්ධන ප්‍රදාන මුදල් වලින් රු.25,423,370 ක් අදාල අරමුණු ඉටුකර ගැනීම සඳහා යොදාගැනීමකින් තොරව ජංගම ගිණුම්වල තැම්පත් කර තිබුණි.

**4.5 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

සමාලෝචිත වර්ෂයේ ආයතනයේ අරමුණු වලට පටහැනිව රු.63,867 ක මුදලක් පුවත්පත් දැන්වීමක් සඳහා වැයකර තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 සංයුක්ත සැලැස්ම**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව ආයතනයේ මෙහෙයුම් කටයුතු සඳහා ඵලදායීව යොදාගැනීමට හා මඟපෙන්වීමට හැකිවනු පිණිස සමාලෝචිත වර්ෂයට පෙර සංයුක්ත සැලැස්ම සකස්කර කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ලබාගත යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

**5.2 ක්‍රියාකාරී සැලැස්ම**

මූල්‍ය හා මෙහෙයුම් කාර්යසාධනය සඳහා නිලධාරීන්ට වගකීම් පැවරෙන පරිදි සමාලෝචිත වර්ෂය ආරම්භයට පෙර ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණු අතර 2014 වර්ෂයේදී

ළඟාකර ගැනීමට/ඉටුකර ගැනීමට බලාපොරොත්තු වූ අභිමතාර්ථ හා ඉලක්ක සහ එහි මූල්‍ය හා භෞතික ප්‍රගතිය විගණනයේදී පරීක්ෂා කිරීමට නොහැකි විය.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවිය.

(අ) ස්ථාවර වත්කම් පාලනය
(ආ) අත්තිකාරම් පාලනය
(ඇ) ගිණුම්කරණය
(ඈ) මූල්‍ය පාලනය